ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

# පෙරහුරු පරීක්ෂණය - 2017

| 11 ශ්‍රේණිය | **පුරවැසි අධ්‍යාපනය I** | කාලය : පැය 01 යි |
|---|---|---|

**සැලකිය යුතුයි**

i. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
ii. අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවල, දී ඇති i, ii, iii, iv පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය හෙවත් නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය මුලින්ම භාවිතයට ගැනුනේ,
i. 17 සියවසේදීය
ii. 18 සියවසේදීය
iii. 19 සියවසේදීය
iv. 20 සියවසේදීය

02. ජාතික රාජ්‍ය බිහිවීම සඳහා අවශ්‍ය ආගමික පදනම ලැබුනේ කුමන ආගමින් ද?
i. හිංදු ආගමෙන්
ii. රෙපරමාදු ආගමෙන්
iii. ඉස්ලාම් ආගමෙන්
iv. ක්‍රිස්තු ධර්මය මගින්

03. නූතන රාජ්‍යයන්හි මූලික වශයෙන් දක්නට ලැබෙන ආණ්ඩු ක්‍රම දෙක වනුයේ,
i. සමාජවාදී ආණ්ඩු, ජනාධිපති ආණ්ඩු
ii. පාර්ලිමේන්තු ආණ්ඩු, ඒකාධිපති ආණ්ඩු
iii. පාර්ලිමේන්තු ආණ්ඩු, ජනාධිපති ආණ්ඩු
iv. පාර්ලිමේන්තු ආණ්ඩු, සමාජවාදී ආණ්ඩු

04. ප්‍රජාතන්ත්‍රවාදය ගොඩනැගීමේ ප්‍රධාන කුලුනක් ලෙස සළකන්නේ,
i. ව්‍යවස්ථාදායකය
ii. විධායකය
iii. අධිකරණය
iv. පාර්ලිමේන්තුව

05. උතුරු පළාතේ පදිංචි දෙමළ වැසියන්ගේ චාරිත්‍රයක් වන "භූමියේ චාරිත්‍රය" අයත් වනුයේ පහත සඳහන් කුමන නීතියට ද?
i. උඩරට නීතියට
ii. තේසවලාමේ නීතියට
iii. මුස්ලිම් නීතියට
iv. මොහොමදියානු නීතියට

06. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා අධිකරණ සංවිධාන පනතට අනුව ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන අධිකරණ පද්ධතිය ඉහළ සිට පහළට නිවැරදිව පෙළගස්වා ඇති පිළිතුර වන්නේ,
i. අභියාචනාධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණය, මහාධිකරණය
ii. මහාධිකරණය, පළාත්බද අධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණය
iii. ශ්‍රේෂ්ඨාධිකරණය, මහාධිකරණය, අභියාචනාධිකරණය
iv. ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, පළාත්බද මහාධිකරණය

07. විධායක සහ පරිපාලන ක්‍රියා මගින් පුරවැසියන්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවන අවස්ථාවලදී ඒවා ආරක්ෂා කිරීමට 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හඳුන්වා ඇති තනතුරකි,
i. නීතිපති
ii. සොලිස්ටර් ජනරාල්
iii. ඔම්බුඩ්ස්මන්
iv. අධිනීතීඥවරයා

08. අතීත ශ්‍රී ලංකාවේ කොළඹ, යාපනය, ගාල්ල යනුවෙන් ප්‍රධාන අධිකරණ දිස්ත්‍රික්ක 03 ක් ක්‍රියාත්මක වූයේ,
i. පෘතුග්‍රීසි පාලන සමයේ
ii. ලන්දේසි පාලන සමයේ
iii. ඉංග්‍රීසි පාලන සමයේ
iv. එළාර පාලන සමයේ

09. ශ්‍රී ලාංකිකයන්ට මුල්වරට ඡන්ද බලය ප්‍රධානය කළ හා සර්වජන ඡන්ද බලය ලැබුණු ආණ්ඩුක්‍රම



www.edudept.up.gov.lk

ප්‍රතිසංස්කරණ දෙක පිළිවෙලින් නම්කර ඇත්තේ,
i. කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ, මැනින් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ
ii. මැනින් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ, මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ
iii. මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ, ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ
iv. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ, සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

10. සුළු නගර සභා සහ ගම් සභා අහෝසි කර දිස්ත්‍රික් සංවර්ධන සභා පිහිටුවන ලද්දේ,
i. 1939 දීය ii. 1956 දීය iii. 1980 දීය iv. 1987 දීය

11. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව සතු බලතල නිවැරදිව දක්වා ඇත්තේ,
i. නීති පැනවීම, විධායකය පාලනය, ප්‍රශ්න ඇසීම
ii. රාජ්‍ය මූල්‍ය පාලනය, නීති පැනවීම, යුක්තිය පසිඳලීම
iii. නීති පැනවීම, ප්‍රශ්න ඇසීම, උපදේශන කාර්යයන්
iv. රාජ්‍ය ආරක්ෂාව, විධායකය පාලනය, ප්‍රශ්න ඇසීම

12. 1957 "රට සභා" 1965 "දිස්ත්‍රික්ක සභා" මගින් මෙරට ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වූයේ,
i. බලය විමධ්‍යගත කිරීම ii. බලය බෙදීම
iii. රට සංවර්ධනය කිරීම iv. රටේ සංවර්ධනය වේගවත් කිරීම

13. සංඝීය රාජ්‍යවල ප්‍රාදේශීය ආණ්ඩු හැඳින්වීමට සාමාන්‍ය වශයෙන් යොදාගනු ලබන්නේ,
i. කැන්ටන් ii. ප්‍රාන්ත iii. පළාත් සභා iv. ප්‍රදේශ

14. එක් මධ්‍යම බල ආයතනයක් පමණක් නීති පැනවීම උත්තරීතර බලය ඉසිලීම ඒකීය ආණ්ඩු ක්‍රමයක මූලික ලක්ෂණය බව ප්‍රකාශ කර ඇත්තේ,
i. A.V. ඩයිසි මහතා ii. C.F. ස්ට්‍රෝන්ග් මහතා
iii. K.C. වියරේ මහතා iv. සීලර් මහතා

15. අනුරාධපුර යුගයේදී ගම් පාලනය කිරීම සඳහා "ගම්භාර" "ගාමිණී" වැනි නිළධාරීන් පත්කළ රජතුමා වන්නේ,
i. මුටසීව රජු ii. මහා පරාක්‍රමබාහු රජු
iii. පණ්ඩුකාභය රජු iv. දේවානම්පියතිස්ස රජු

16. ඇමරිකානු ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුව වර්තමානයේ දක්නට ලැබෙන ප්‍රාන්ත රාජ්‍ය ගණන වන්නේ,
i. 13 කි ii. 26 කි iii. 35 කි iv. 50 කි

17. බහු සංස්කෘතිකභාවය හොඳින් ප්‍රයෝජනයට ගෙන "වෙනස්කම් තුළින් එකමුතු බව" යන්න තේමා කරගෙන සංවර්ධනය කරා ගමන් කල රාජ්‍යයන් දෙකක් නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.
i. සිංගප්පූරුව, ස්විට්සර්ලන්තය ii. ඇමරිකාව, බ්‍රිතාන්‍ය
iii. සිංගප්පූරුව, ඇමරිකාව iv. ස්විට්සර්ලන්තය, බ්‍රිතාන්‍ය

18. ශ්‍රී ලංකාවේ වෙසෙන ජනවර්ග ජන සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස ගත්විට නිවැරදිව අවරෝහණ ක්‍රමයට දක්වා ඇති පිළිතුර තෝරන්න.
i. සිංහල, ලංකා දෙමළ, ඉන්දියා දෙමළ, යෝනක
ii. සිංහල, ලංකා දෙමළ, යෝනක, ඉන්දියා දෙමළ
iii. සිංහල, ඉන්දියා දෙමළ, ලංකා දෙමළ, යෝනක
iv. සිංහල, ඉන්දියා දෙමළ, යෝනක, ලංකා දෙමළ

19. නිෂ්පාදනය සඳහා යොදවනු ලබන ප්‍රාග්ධනයට කරනු ලබන ගෙවීම් හඳුන්වනු ලබන්නේ,
i. බදුකුලී ii. වැටුප් iii. පොළී iv. ලාභ

20. නිෂ්පාදනය කරන භාණ්ඩ ප්‍රායෝජනයට ගන්නා ආකාරය අනුව කොටස් තුනකට නිවැරදිව බෙදා ඇති පිළිතුර තෝරන්න,
ii. පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ, ප්‍රාග්ධන භාණ්ඩ
ii. පාරිභෝගික භාණ්ඩ, කෘෂිකාර්මික භාණ්ඩ, ප්‍රාග්ධන භාණ්ඩ
iii. පාරිභෝගික භාණ්ඩ, වෙළඳ භාණ්ඩ, ප්‍රාග්ධන භාණ්ඩ
iv. පාරිභෝගික භාණ්ඩ, වෙළඳ භාණ්ඩ, කෘෂිකාර්මික භාණ්ඩ

21. A - මහා බ්‍රිතාන්‍ය



www.edudept.up.gov.lk

B - ජපානය
C - උතුරු කොරියාව
D - කියුබාව
E - ශ්‍රී ලංකාව

ඉහත දක්වා ඇති රාජ්‍යයන්ගෙන් ධනවාදී හා සමාජවාදී රාජ්‍යයන් පිළිවෙලින් නම්කර ඇති පිළිතුර තෝරන්න.

i. A හා B ii. B හා C
iii. C හා D iv. D හා E

22. මිශ්‍ර ආර්ථික ක්‍රමයක් පවතින රට කුමක් ද?
i. B ii. C iii. D iv. E

23. සංවර්ධනය පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවිධානය ක්‍රි.ව. 2000 දී පැවැත්වූ සහස්‍රක සමුළුවේ දී සහස්‍රක සංවර්ධන ඉලක්ක 8 ක් සම්මත කරගන්නා ලදී. ඊට අදාළ නොවන පිළිතුර තෝරන්න.
i. දුප්පත්කම හා සාගින්න තුරන් කිරීම ii. ළදරු මරණ අනුපාතිකය අඩුකිරීම
iii. මානසික සෞඛ්‍ය වර්ධනය iv. රාජ්‍ය ව්‍යවසාය කටයුතුවලින් ඈත්වීම

24. ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට ඇතිවී තිබෙන සෘණාත්මක බලපෑම මින් කුමක් ද?
i. බුද්ධිගලනය වේගවත් වීම
ii. ආර්ථිකය විවිධාංගිකරණය වීම
iii. විවිධ කලාපීය සංවිධාන හා එකතුවීමේ හැකියාව
ii. ගෙවුම් ශේෂ තත්වය යහපත් වීම

25. ගැටුම් නිරාකරණයේ දී මැදිහත්කරුවෙකු තුළ තිබිය යුතු ගුණාංගයක් වන්නේ,
i. තමාගේ විසඳුම් ක්‍රියාත්මක කිරීම
ii. දෙපාර්ශවයටම බලපෑම් එල්ල කිරීම
iii. ජය-පරාජය විසඳුම් ලබාදීම
iv. විචාරශීලීව හා නිර්මාණශීලීව කටයුතු කිරීම

26. අයිතිවාසිකම් දිනාගැනීම සම්බන්ධයෙන් වැදගත්වන ඓතිහාසික අවස්ථා 4 ක් පහත දක්වේ. එයින් සාවද්‍ය පිළිතුර තෝරන්න.
i. 1698 බ්‍රිතාන්‍ය අයිතිවාසිකම් පිළිබඳ පනත ii. 1776 ඇමරිකානු නිදහස් සටන
iii. 1789 ප්‍රංශ ප්‍රකාශනය iv. 1917 රුසියානු විප්ලවය

27. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කරගන්නා ලද්දේ,
i. 1945 ජූලි 10 ii. 1948 දෙසැම්බර් 10
iii. 1948 ඔක්තෝබර් 24 iv. 1946 අගෝස්තු 15

28. පරිසර සංරක්ෂණය ප්‍රධාන තේමාව කරගෙන පිහිටුවා නොමැති ආයතනය කුමක් ද?
i. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ii. සමුද්‍රිය පරිසර ආරක්ෂක අධිකාරිය
iii. පොලිස් දෙපාර්තමේන්තුව iv. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව

අංක 29 හා 30 සඳහා පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි පිළිතුර තෝරන්න.

A 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
B 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
C 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
D 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

29. අග්‍රාණ්ඩුකාරවරයෙකු හා නාමමාත්‍රික ජනාධිපතිවරයෙකු දැකිය හැක්කේ,
i. A, B ii. B, C iii. C, D iv. A, D

30. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තුළ මුල්වරට මූලික අයිතිවාසිකම් ඇතුලත් කරනු ලැබුවේ,
i. A ii. B iii. C iv. D

www.edudept.up.gov.lk

31. සංවර්ධනය මැනීමට යොදාගන්නා සාම්ප්‍රදායික මිනුමක් වන්නේ මින් කුමක් ද?
i. අන්තර්ජාල භාවිතය ii. මානව පීඩන දර්ශකය
iii. මානව සංවර්ධන දශකය iv. ආර්ථික වර්ධන වේගය

32. සංවර්ධනය මැනීමට භාවිතා කරන සාම්ප්‍රදායික හා නූතන මිනුම් උපයෝගී කරගෙන සංවර්ධන මට්ටම අනුව නිවැරදිව රටවල් වර්ගකර ඇත්තේ,
i. දිළිඳු රටවල්, සංවර්ධිත රටවල්
ii. සංවර්ධනය වූ රටවල්, සංවර්ධිත රටවල්
iii. සංවර්ධනය වන රටවල්, සංවර්ධිත රටවල්
iv. සංවර්ධනය නොවූ රටවල්, සංවර්ධිත රටවල්

33. සම්පත්වල ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය වැඩිකිරීම මගින් තිරසාර සංවර්ධනය ලඟා කරගත හැකිය. මේ සඳහා ලෝකය යොදාගන්නා ක්‍රමවේදය වන්නේ,
i. 3R සංකල්පය ii. 5S සංකල්පය
iii. 5R සංකල්පය iv. 3S සංකල්පය

34. ශ්‍රී ලංකාව සංවර්ධන අභියෝග ජයගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ගයක් නොවන්නේ,
i. නව කාර්මික රටවල්වලින් එල්ලවන වෙළඳපොළ තරගය
ii. අපනයන අභිමුඛ කර්මාන්ත දිරිගැන්වීම
ii. අපනයන විවිධාංගීකරණය
iv. සංචාරක කර්මාන්තය දියුණු කිරීම

35. ශ්‍රී ලංකාවේ මෑතකාලීනව දිළිඳුකම තුරන් කිරීම සඳහා ගෙන ඇති ප්‍රධාන වැඩසටහන වන්නේ,
i. මගනැගුම වැඩසටහන ii. ගම නැගුම වැඩසටහන
iii. සමෘද්ධි වැඩසටහන iv. දිවා ආහාර ලබාදීම

36. සාර්ක් සංවිධානයට අයත් නොවන රටක් දැක්වෙන පිළිතුර තෝරන්න,
i. ඉන්දියාව, ලංකාව, පාකිස්ථානය, නේපාලය
ii. ලංකාව, පාකිස්ථානය, නේපාලය, භූතානය
ii. ඇෆ්ගනිස්ථානය, නේපාලය, භූතානය, මාලදිවයින
iv. කසකස්ථානය, නේපාලය, භූතානය, මාලදිවයින

37. පහත සඳහන් සංවිධාන අතරින් කලාපීය සංවිධානයක් නොවන්නේ කුමක් ද?
i. සාර්ක් සංවිධානය ii. කොළඹ ක්‍රමය
iii. ආසියාන් සංවිධානය iv. එක්සත් ජාතීන්ගේ සංවිධානය

38. ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීමෙහිලා බල නොපාන සාධකයකි,
i. සම්පත් විසංතුලනය ii. ප්‍රවාහන දියුණුව
iii. දියුණු තාක්ෂණයක් රටතුළ පැවතීම iv. අතිරික්ත නිෂ්පාදන අලෙවිකර ගැනීම

39. වර්තමානයේදී ශ්‍රී ලංකාවේ ඇති පළාත් හා දිස්ත්‍රික්ක නිවැරදිව දක්වා ඇත්තේ,
i. 7, 25 ii. 8, 26 iii. 9, 26 iv. 9, 25

40. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව දැනට පළාත් සභාවක පත්කළ හැකි උපරිම අමාත්‍ය සංඛ්‍යාව වන්නේ,
i. 3 කි ii. 4 කි iii. 7 කි iv. 10 කි

www.edudept.up.gov.lk